www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය හා 2005 වසරේ මහා මැතිවරනය

## British working class and the 2005 general election

**බ්‍රිතාන්‍යයේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශයකි / 2005 අප්‍රේල් 12**

මැයි 5 වැනි දා පැවැත්වීමට නියමිත මහා මැතිවරනයෙහි දී කම්කරු පන්තිය මුහුන දෙන අතිමූලික ගැටලුව වනුයේ රටින් පිට අධිරාජ්‍යවාදී යුදවාදය හා රට තුල සමාජමය ප්‍රහාර පිලිබඳ ලේබර් පක්ෂ ආන්ඩුවේ ප්‍රතිපත්ති අරබයා ස්වාධීන දේශපාලන ප්‍රතිචාරයක් සකස් කර ගැනීම යි.

කොන්සර්වටිව් පක්ෂයට එරෙහිව ජනතාවගේ විරෝධතා රැල්ලක් මත 1997 වසරේ දී ලේබර් පක්ෂය තේරී පත් වීමෙන් අනතුරුව, ආන්ඩුවට සහාය නොදක්වන්නේ නම් ටෝරීන් නැවත බලයට පත් වීමට පමනක් ඉඩ සැලසෙන බවට කෙරෙන අනතුරු ඇඟවීමක් තුලින් සිය දක්ෂිනාංශික න්‍යාය පත්‍රය පිලිබඳ වර්ධනය වන අතෘප්තිය අකර්මන්‍ය කිරීමට ලේබර් පක්ෂය උත්සුක වී ඇත.

එනමුදු, පසු ගිය වසර අට තුල පැහැදිලි වී ඇති පරිදි ''නව ලේබර් පාක්ෂිකයන්'' හා කොන්සර්වටිව් පාක්ෂිකයන් අතර කිසිදු ප්‍රතිපත්තිමය කරුනක් සම්බන්ධයෙන් වැදගත් වෙනසක් දක්නට නැත. මහා ව්‍යාපාරවල ඉල්ලීම් වඩාත් සාර්ථක ලෙස සපුරා ලිය හැකි ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම සඳහා ඔවුහු එකිනෙකා අතර තරගයක යෙදී සිටිති.

ඉරාකයට එරෙහි ආක්‍රමනශීලී නීති විරෝධී යුද්ධයකට බ්‍රිතාන්‍යය පටලැවීමෙන් යන්තම් වසර දෙකක් ඉක්ම යද්දී තෙවෙනි වරටත් බලයට පත් වීමේ උත්සාහයක ලේබර් පක්ෂය යෙදී සිටියි. සෑම දිනක් පාසා ම සිරියාවට, ඉරානයට, උතුරු කොරියාවට හා තවත් රාජ්‍යයන්ට එරෙහිව නව තර්ජන එල්ල කෙරෙන අතර පාලන තන්ත්‍ර වෙනස් කිරීම සඳහා එම රාජ්‍යයන් ඉලක්ක කොට ගෙන ඇත්තේ, ''කුරිරු පාලනයට එරෙහි'' ජාත්‍යන්තර ''යුද්ධයක්'' ලෙස වොෂින්ටනය විසින් එය යලි බෞතීස්ම කර තිබෙන තත්වය තුල, එය පිටුපසින් භූගෝලීය ආධිපත්‍යය සඳහා වූ එක්සත් ජනපද පාලනාධිකාරයේ ගමන පෙරට තල්ලු වෙන අතර ය.

යුද ආයාසයකට සමගාමීව, දිගු කලක් භුක්ති විඳි ප්‍රජාතාන්ත්‍රිය අයිතීන්ට එරෙහිව ලේබර් පක්ෂය ක්‍රමවත් ප්‍රහාරයක් එල්ල කරයි. මෙය ඉලක්ක කොට ඇත්තේ, බ්‍රිතාන්‍යය නව විජිතවාදයක නව යුගයකට සහභාගි වීමට එරෙහි සියලු විරෝධතාවන් ද පොදු ජනතාවගේ වියදමෙන් මූල්‍ය කතිපයාධිකාරයට වාසි සැලසෙන පරිදි ආර්ථික හා සමාජ සබඳතා යලි හැඩ ගැස්වීම සඳහා ආන්ඩුව ගන්නා උත්සාහයන්ට එරෙහි සියලු විරෝධතාවන් ද යටපත් කිරීම සඳහා ය.

ලේබර් පක්ෂයට ඡන්දය දෙන ලෙස සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා නො සිටී. කම්කරු පන්තියේ අවශ්‍යතාවන්ගේ දේශපාලන නියෝජිතයා ලෙස ලේබර් පක්ෂය පෙනී සිටි කාල පරිච්ඡේදය ගෙවී දැන් බොහෝ කලක් ගත වී ඇත. අගමැති ටෝනි බ්ලෙයාර් වටා සිටින කල්ලිය විසින් දිගු ක්‍රියාවලියක කූට ප්‍රාප්තිය ලෙස ''නව ලේබර් පක්ෂය'' ප්‍රකාශ කිරීම වූ කලි පක්ෂ නායකත්වය හා වෘත්තීය සමිති නිලධරය තුල එහි ආධාරකරුවන් ධනවාදයට එරෙහි ප්‍රතිපත්ති සමග සියලු සබඳතාවන් අත හැර දැමීම යි.

මහා ව්‍යාපාරයන් විසින් කම්කරු පන්තිය සූරා කෑමේ දී එයට සීමා පැනවීම සඳහා පාර්ලිමේන්තුව තුලින් ප්‍රතිසංස්කරන ගෙන ඒමේ ලේබර් පක්ෂ පැරනි වැඩ පිලිවෙල අත හැර දමන ලද්දේ මීට දශක තුනකට පෙර ය. එකල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන නය හිමියන් ඉල්ලා සිටි වැටුප් කැටි කිරීම හා අතිකූත් වැදගත් සමාජ විරෝධී ප්‍රහාර එවකට පක්ෂ නායක ජේම්ස් කැලහන් විසින් යුක්ති සහගත කෙරුනේ, ''බදු කපා හැරීම හා ආන්ඩුවේ වියදම් වැඩි කිරීම මගින් අවපාතයෙන් ඔබට මිදිය හැකිය යි අප කල්පනා කිරීමට පුරුදු වී සිටියේ වී නමුත් එම විකල්පය තව දුරටත් නොපවත්නා බව නිර්ව්‍යාජව ම මට පැවසිය හැකි ය'' යි ඔහු ප්‍රසිද්ධියේ ම කියා සිටියේ ය.

අද ලේබර් පක්ෂය තව දුරටත් කම්කරු පන්තියේ පක්ෂයක් ලෙස පෙනී සිටින බවක් ඇඟවීමට උත්සාහ නොකරන අතර මහා ව්‍යාපාර අරබයා එහි අචල පක්ෂපාතිත්වය පිලිබඳව සමාවට කරුනු කියන්නේ ද නැත. තව ද, නිල දේශපාලනය තුල ලේබර් පක්ෂයේ දක්ෂිනාංශික ක්‍රියා මාර්ගවලට සැබෑ විරෝධතාවක් ද නොමැත. මුල දී තමන් ලේබර් පක්ෂයේ වාමාංශය ලෙස පෙනී සිටීමට ලිබරල් ඩිමොක්‍රැටිකයන් උත්සුක වූ නමුදු, ව්‍යාපාර ලොවේ සහාය ලබා ගැනීමේ දී බ්ලෙයාර් සමග තරගයක යෙදී සිටින ඔවුහු තව තවත් දකුනට හැරෙමින් සිටිති.

ලේබර් පක්ෂයට සමාජවාදී විකල්පයක් සපයන බව කියා පාමින් මෑත වසර කිහිපය තුල ඉස්මතු වී ඇති කිසිදු කන්ඩායමක් කම්කරු ජනතාව වෙත නව

දේශපාලන නිවහනක් පිලිගන්වා නැත. බ්ලෙයාර්ට හා ඔහුගේ යුද පිලිවෙතට එදිරි වන්නන්ගෙන් සහාය ගොනු කර ගැනීමට උත්සුක වන එම කන්ඩායම්වල ප්‍රතිපත්ති තුල කම්කරු පන්තියේ රැකියා හා සමාජ තත්වයන් ආරක්ෂා කිරීමට පැහැදිලි ලෙස ම අසමත් වූ ප්‍රතිසංස්කරනවාදී ප්‍රතිපත්ති යලි සකස් කර ඉදිරිපත් කිරීමකට වැඩි යමක් නැත.

මෙමගින් කම්කරු පන්තියේ ප්‍රජා අයිතිය අහෝසි වී ඇති අතර සිය ස්වාධීන අවශ්‍යතාවන් සම්බන්ධයෙන් හඬක් නැංවීමට දේශපාලන යන්ත්‍රනයක් කම්කරු පන්තියට ඉතිරි වී නැත.

බ්ලෙයාර් කෙරේ පවතින පුලුල් විරෝධය පෙර නොවූ විරූ අන්දමේ විරෝධතා අපේක්ෂකයින් හා පක්ෂවලට කොන්දේසි සකසා ඇත. එනමුදු, එවැනි ''තනි ප්‍රශ්න'' කැටි කර ගත් දේශපාලනයෙන් ප්‍රගතිශීලී කිසිවක් ඉස්මතු නොවනු ඇත. ආන්ඩුව කෙරේ කෝපය සනිටුහන් කිරීම ප්‍රමානවත් නො වේ. යුද ව්‍යාපාරය හා කම්කරුවන්ගේ ජීවන තත්වයන් හා ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් මත එල්ල කෙරෙන ප්‍රහාරවලට සාර්ථකව විරුද්ධ විය හැක්කේ ඒවායේ මූලයන් — එනම්, ධනවාදී ලාභ ක්‍රමය සම්බන්ධයෙන් විසඳුම් සෙවීමෙන් පමනි.

මෙම මැතිවරනයෙන් පැන නැගෙන සාරභූත ප්‍රශ්නය වනුයේ නව පක්ෂයක් ගොඩ නැගීමේ හදිසි අවශ්‍යතාව යි. ජාත්‍යන්තර හා සමාජවාදී වැඩ පිලිවෙලකින් සන්නද්ධ විය යුතු එම පක්ෂය යුද්ධයට, විජිතවාදයට හා සමාජ අසමානතාව වැඩී යාමට එරෙහිව කම්කරු පන්තිය මෙහෙයවීමට කැප විය යුතු ය. හතර වැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය එවැනි ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කරයි.

### ඉරාකය හා විජිතවාදය සහ යුද්ධය වෙත හැරීම

1991 වසරේ සෝවියට් සංගමය කඩා වැටීමත් සමග, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය අභියෝගයට ලක් නොවූ සිය භූගෝලීය ආධිපත්‍යය පිලිබඳ අරමුන අවසාන වසයෙන් සාක්ෂාත් කර ගැනීමට ඉදිරිපත්ව සිටී.

ඇෆ්ඝනිස්ථානය ආක්‍රමනය කර යටත් කර ගැනීමටත් ඉරාකය අත්පත් කර ගැනීම සඳහා එම රටට එරෙහිව නීති විරෝධී යුද්ධයක් දියත් කිරීමටත් නිමිත්ත වසයෙන් බුෂ් පරිපාලනය 2001 සැප්තැම්බර් මස ලෝක වෙලඳ මධ්‍යස්ථානයට එල්ල කරන ලද ත්‍රස්ත ප්‍රහාර නරුම ලෙස ප්‍රයෝජනයට ගත්තේ ය. ඒ තුලින් ලෝකයේ වැදගත් ම තෙල් නිෂ්පාදන කලාප දෙකක් වන කැස්පියන් ද්‍රෝනිය ද මැද පෙරදිග ද ගෙල මිරිකා ගැනීමට එක්සත් ජනපදයට ඉඩ සැලසුනි.

මෙසේ යුදවාදය හා විජිත අත්පත් කර ගැනීම වෙත හැරීම හුදෙක් ධවල මන්දිරයෙහි රිපබ්ලිකන් පාක්ෂික කල්ලියේ ආත්මීය අභිප්‍රායයන්ගේ නිමැවුමක් ම නො වේ. කවුරුන් බලයේ සිටිය ද සිදුවීම්වල මූලික වෙනසක් නොවනු ඇත. යුද ව්‍යායාමය වූ කලි එක්සත් ජනපද ධනවාදයෙහි නො විසඳිය හැකි ආර්ථික හා සාමාජීය ප්‍රතිසතිතතාවේ නිමැවුමකි. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ප්‍රචන්ඩකාරී පිපිරීම වූ කලි, එක ජාතියකගේ — එනම් එක්සත් ජනපදයේ — ආධිපත්‍යය අන් සියලු ජාතීන් මත පිහිටුවීම මගින්, භූගෝලීය වසයෙන් සංකලිත ලෝක ආර්ථිකයක් හා ජාතික රාජ්‍යයන් වසයෙන් ලොව බෙදී යාමේ අතිමූලික ප්‍රතිවිරෝධය අභිභවා යෑමට ධනේශ්වරයේ පැත්තෙන් දැරෙන උත්සාහය යි.

සිය මිලිටරි සුපිරි බලය සැහැසි ලෙස පෙරමුනට ගැනීම මගින් තම ආර්ථික පිරිහීම හා ආසියාතික හා යුරෝපා ප්‍රතිමල්ලවයන්ගේ අභියෝගය ව්‍යර්ථ කිරීමට ඇමරිකාව බලාපොරොත්තු වෙයි. මේ මග ගත් විට ආපසු හැරීමක් නැත. ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් දෙවැනි වරට යලි තේරී පත් වීමෙන් අනතුරුව, ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක මුල් ප්‍රතිඥාවේ පුරසාරම වෙනුවට සියල්ල වඩාත් හොඳින් අන්තර්ගත කර ගත් ''කෲරත්වයට එරෙහි යුද්ධය'' ගෙන යාමේ පොරොන්දුවක් ආදේශ කර ඇත. ඉරාක යුද්ධයට ප්‍රථමයෙන් කලාක් මෙන්, අල් කයිඩා සංවිධානය සමග සබඳකම් හෝ ජන සංහාරක අවිවලින් ඇති විය හැකි තර්ජනයක් සම්බන්ධයෙන් හෝ ප්‍රබන්ධ ගෙතීමකින් තොරව, නව ධජයේ සෙවනැල්ල යටතේ වොෂින්ටනයට තමන් තෝරා ගන්නා ඕනෑ ම රටක් ඉලක්ක කොට ගැනීමේ හැකියාවක් ඇත.

''පාලන තන්ත්‍ර වෙනසක්'' හා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කිරීම අතර කිසිදු සම්බන්ධයක් නැත. එය යොමු කොට ඇත්තේ ප්‍රධාන අන්තර්ජාතික සංගත හා බැංකුවල නිර්බාධිත පාලනයක් පීඩිත ජනතාව මත පැටවීමට ය. බලයේ සිටින ආන්ඩු මට්ටු කිරීම හෝ එක්සත් ජනපදයෙහි සහාය ලත් විරුද්ධ පක්ෂවල හොඳ හිත වගා කර ගැනීම හෝ කල නොහැක්කේ නම් අවි බලයෙන් තමන්ට අවනත වන ආන්ඩුවක් ස්ථාපනය කරනු ඇත.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ නව හැරීමෙහි වඩාත් ප්‍රමුඛ සහචරයා වී ඇත්තේ බ්ලෙයාර් ය. වොෂින්ටනයෙහි අනුග්‍රහය දිනා ගැනීමෙන් යුද්ධයේ වාසිවලින් කොටසක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය වෙනුවෙන් ඩැහැ ගැනීමටත් සිය ප්‍රධාන යුරෝපා ප්‍රතිමල්ලවයන් වන ජර්මනියට හා ප්‍රන්සයට එරෙහිව සිය හස්තය ශක්තිමත් කර ගැනීමටත් ඔහු අපේක්ෂා කරයි.

එක්සත් ජනපද ප්‍රචාරයේ සෑම හැරීමක් ම පෙරලීමක් ම ඔහුගේ ආන්ඩුව විසින් ප්‍රතිරාවය කරනු ලැබ ඇත. එක්සත් ජනපද ආක්‍රමනය පසු පස පෙල ගැසීමට බ්ලෙයාර්ට ඕනෑ ම නිමිත්තක් ප්‍රමානවත් වනු ඇත. එනම් ඉරාකය සතුව ජන සංහාරක අවි තිබූ බවට කරන ලද ව්‍යාජ ප්‍රකාශය, ඉරානයේ හා උතුරු කොරියාවේ න්‍යෂ්ටික වැඩ පිලිවෙල, සිරියාව ලෙබනනය තුල රැඳී සිටීම හෝ අප්‍රිකානු රටවල් ගනනාවක ආන්ඩුවල දූෂනයන් ය.

බ්ලෙයාර්ගේ ප්‍රතිපත්ති හේතු කොට ගෙන බ්‍රිතාන්‍ය

ධනේශ්වරයේ බලගතු කොටස්වල සහාය ලබා ගැනීමට ඔහුට හැකි වී ඇතත් එක්සත් ජනපදය සමග වඩා සමීප සන්ධානයක් ඇති කර ගැනීමෙන් බ්‍රිතාන්‍යයේ ජාතික අවශ්‍යතාවන් අනතුරට හෙලනු ඇතැයි බිය වී සිටින සංස්ථාපිතයෙහි ඇතැම් කොටස් තුල විසංවාදයක් අවුලුවා ලීමට එය හේතු වී ඇත. එනමුදු මේ කවයන් අතර බ්ලෙයාර්ගේ මූලෝපායට ප්‍රතිවිරුද්ධ ඒකායන මූලෝපායක් නොමැත. ඔහුගේ ආස්ථානය බ්‍රිතාන්‍යයෙහි අධිරාජ්‍යවාදී ධනේශ්වරය මුහුන දෙන උභතෝකෝටිකයෙහි ප්‍රකාශනයකි. කෙසේ ද යත්, යුරෝපය හා වඩාත් සමීප ආර්ථික සබඳතාවන් ගොඩ නගා ගැනීමටත් යුරෝපා වෙලඳ කන්ඩායම තුල තැනක් හිමි කර ගැනීමටත් ඔවුන්ට අවශ්‍ය වන නමුදු, සිය ප්‍රධාන යුරෝපා ප්‍රතිමල්ලවයන් වන ජර්මනියට හා ප්‍රන්සයට එරෙහිව බ්‍රිතාන්‍ය අවශ්‍යතාවන්ගේ ලීවර පෙරට ගැනීම සඳහා එක්සත් ජනපදය සමග ඇති සිය ''විශේෂිත'' දේශපාලන හා ආර්ථික සබඳතා මත විශ්වාසය තැබීමේ තත්වයකට ඔවුහු මුහුන පා සිටිති.

මේ සමතුලනය තබා ගැනීම සඳහා, ඉරාක යුද්ධයෙහි බ්ලෙයාර්ගේ සහභාගිත්වයට එරෙහිව දේශපාලන සංස්ථාපිතය තුලින් පැන නගින විවේචනවලට උපායික හා මුලුමනින් ම ප්‍රතිපත්ති විරහිත ස්වරූපයක් ඇතුලු කරවයි. ලිබරල් ඩිමොක්‍රැටිකයෝ ද රොබින් කුක් හා ක්ලෙයාර් ෂෝර්ට් වැනි ලේබර් පාක්ෂිකයෝ ද යුදවාදයට හා කුඩා ජාතීන් යටපත් කිරීමට විරුද්ධ වන්නෝ නො වෙති. ඔවුන් සරල ආකාරයට තර්ක කොට ඇත්තේ, වොෂින්ටනයේ ඒකපාර්ශ්වීය අභිලාෂයන් මැඩ පැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය උපයෝගි කර ගැනීමට යුරෝපා බලවතුන් ගන්නා උත්සාහයන්ට සහාය වීම මගින්, ලෝකයේ මූලෝපායිකව වැදගත් ප්‍රදේශවල බ්‍රිතාන්‍යයෙහි අවශ්‍යතාවන් වඩාත් සුරක්ෂිත කර ගත යුතු බව යි. අවසානයේ දී, බ්ලෙයාර්ගේ නාමික විරුද්ධවාදීන්ගෙන් වැඩි දෙනා සිය විවේචන අත් හැර බ්ලෙයාර් සමග පෙල ගැසී ඇත.

බර්ලිනය හා පැරීසිය සමග සන්ධානගත වීම හා/හෝ එක්සත් ජාතීන්ට සහාය වීම, වොෂින්ටනය සමග බ්ලෙයාර්ගේ සම්මුතියට වඩා කිසිදු අයුරකින් ප්‍රගතිශීලී වන්නක් නො වේ. එය යුදවාදය හා යුද්ධය කරා ගන්නා වෙනස් මගක් පමනි. සැබවින් ම, එක්සත් ජනපදය සමග සිය සමීප සන්ධානය පවත්වා ගෙන යාමට උත්සුක වන අතරවාරයේ ම යුරෝපා වෙලඳ හා මිලිටරි හවුල තුල බ්‍රිතාන්‍යයට තැනක් සහතික කර ගැනීමේ උත්සාහයක බ්ලෙයාර් යෙදී සිටියි. වොෂින්ටනය සැනසීමට බ්‍රිතාන්‍යය ගන්නා උත්සාහයන් ප්‍රතිරාවය කිරීම ද ලෝකයේ සම්පත් හා වෙලඳ පොලවල් යලි බෙදා ගැනීම සඳහා වූ ව්‍යාපාරයේ දී සිය පාර්ශ්වයේ මිලිටරි ශක්තිය ගොඩ නැගීමට උත්සුක වීම ද අතර ජර්මනිය හා ප්‍රන්සය දෙගිඩියා සහගත වෙති.

**ප්‍රජාතාන්ත්‍රීය අයිතීන්ට එරෙහි ප්‍රහාරය**

යුදවාදයට හැරීම දැනට මත් දැවැන්ත මිලක් මිරිකා ගෙන තිබේ. ගැටුමෙහි ප්‍රතිඵලයක් වසයෙන් මරනයට පත් වූ ඉරාක ජාතිකයන්ගේ සංඛ්‍යාව 1,00,000කැයි ගනන් බලා ඇත. බ්‍රිතාන්‍ය සොල්දාදුවන් 9,000ක් පමන ඉරාකයෙහි රඳවා ඇත. වොෂින්ටනය තීරනය කරන වෙනත් ඕනෑ ම ක්‍රියාවක් සඳහා අමතර සොල්දාදුවන් යැවීමට ද ප්‍රතිඥා දෙනු ඇත. මේ හේතුවෙන් එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය සොල්දාදුවන් 1,500ක් මිය ගොස් ඇති අතර 11,000කට ආසන්න පිරිසක් තුවාල ලබා ද තවත් ගනන් බැලිය නොහැකි සංඛ්‍යාවක් ප්‍රචන්ඩත්වයට යොමු කර ද ඇත. යුද්ධය සඳහා බ්‍රිතාන්‍යයේ බදු ගෙවන්නන්ට පවුම් බිලියන 7කට අධික මිලක් ගෙවීමට සිදු වෙතැයි ගනන් බලා ඇත.

ඉතා මත් අශෝභන වූ මෙම චිත්‍රය වුව ද බ්ලෙයාර් යුද්ධයට අනුබල දීමේ ප්‍රතිඵල ප්‍රමානවත් ලෙස විස්තර නො කරයි. ''කුරිරු බවට එරෙහි යුද්ධයක්'' වඩාත් ම සුදුසු පාර්ශ්වයන් වෙත එල්ල කෙරෙන්නේ නම්, බ්ලෙයාර් ආන්ඩුව ප්‍රමුඛ ඉලක්කයක් වනු ඇත.

ත්‍රස්ත විරෝධී මැත දෙඩවුම් සිවිල් නිදහස පාගා දැමීම සඳහා නිදහසට කරුනක් ලෙස පසු ගිය කාල පරිච්ඡේදය තුල දී ලේබර් පක්ෂය විසින් උපයෝගි කොට ගෙන ඇත. ගුවන්තනාමෝ කඳවුරෙහි නඩු නොමැතිව සිය ගනන් මිනිසුන් රඳවා තබා ගැනීම්වලට ද අබු ග්‍රයිබ් සිර කඳවුරෙහි හා කැම්ප් බ්‍රෙඩ්බාස්කට්හි කරන ලද දරුනු වධහිංසාවලට ද ආන්ඩුව සෘජුව සම්බන්ධ වී ඇතිවා පමනක් නො ව රට තුල ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ද එවැනි ම සතුරු බවක් පෙන්නුම් කොට ඇත.

කුපිත නොකරන ලද ආක්‍රමනකාරී යුද්ධයක් නීති යුක්ත කිරීම සඳහා බ්‍රිතාන්‍ය ජනතාව ක්‍රමානුකූලව රවටනු වස් ආන්ඩුවේ ද රජයේ ද ජනමාධ්‍යවල ද මුලු පැලැන්තිය ම බලමුලු ගන්වා ඇත. යුද අරමුනු ක්‍රියාවට නැංවීමේ දී කුමන බොරුවක් හෝ තද වැඩි ය යි නො සැලකේ. ඉරාකයෙන් එල්ල විය හැකි ක්ෂනික තර්ජනයකට රට මුහුන පා සිටින්නේ ය යන උද්වේගී ප්‍රකාශ නිකුත් කිරීමෙන් බ්ලෙයාර් බ්‍රිතාන්‍ය ජනතාව බිය වැද්දීමට තැත් කල අතර, ඔත්තු සේවා තොරතුරු හා වාර්තා ව්‍යාජ ලෙස වෙනස් කිරීමෙන් යුද්ධය නීති යුක්ත කිරීම සඳහා තිරයෙන් පිටු පස ලිපිගොනු සැකසීම ආරක්ෂක අංශ වෙත පැවරුනි.

පෙර නොවූ විරූ අන්දමේ මෙම ප්‍රචාරක ව්‍යාපාරය ඉදිරියෙහි වුව ද බොහෝ කම්කරුවෝ එය විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කල අතර අසාධාරන හා අනවශ්‍ය ය යි තමන් සැලකූ යුද්ධයකට එරෙහිව දසලක්ෂ සංඛ්‍යාත වාර්තාගත ජනකායක් පෙලපාලි දැක්වූහ. මෙයට බ්ලෙයාර්ගේ ප්‍රතිචාරය වූයේ පොදු ජන අභිමතය මත ක්‍රියා කිරීමට තමන් බැඳී නැති බව ය. වගකිව යුතු ප්‍රජාතන්ත්‍රවාදයේ ලකුනක සේයාවකුදු නොමැති තරමට එය කෙලෙසී ඇති ප්‍රමානය පෙන්නුම් කෙරෙන ප්‍රකාශයක් නිකුත් කරමින් බ්‍රිතාන්‍යයට වඩාත් ම යහපත් දේ කුමක් දැයි තීරනය කරන්නේ තමා

පමනක් බව බ්ලෙයාර් ප්‍රකාශ කලේ ය.

මෙය සරලව ම දූෂිත පරිපාලනයක ක්‍රියා කලාපය නො වී ය. ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කර ගැනීමට කැප වුනු සැලකිය යුතු කොටසක් බ්‍රිතාන්‍ය සංස්ථාපිතය තුල නොමැති බව ඉරාක යුද්ධය හා ඉන් ඉක්බිතිව ඇති වී තිබෙන තත්වය තුලින් තහවුරු වී ඇත. සංකේතාත්මක විරෝධයක් පමනක් දක්වමින් ඉරාකය ආක්‍රමනයට බ්‍රිතාන්‍යයේ සහභාගිත්වය පාර්ලිමේන්තුව විසින් අනුමත කෙරුනේ ඉන් පසුව ද යුද ව්‍යාපාරය පිටු පස පෙල ගැසුනි. යුද්ධය සාධාරනීකරනය සඳහා උපයෝගි කර ගත් තුනී බොරු වැල ලිහී යත් ම පවත්වන ලද පරීක්ෂනවලින් සුවිශේෂී එකක් වූ කලින් අවි පරීක්ෂක වශයෙන් සේවය කල ආචාර්ය ඩේවිඩ් කෙලීගේ මරනය පිලිබඳව හට්න් සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද පරීක්ෂනයෙන් ප්‍රකාශ වූයේ බ්ලෙයාර් ආන්ඩුව කිසිදු වැරදි ක්‍රියාවක් නො කල බව ය.

ආන්ඩුවට කිසිදු අභියෝගයක් එල්ල කිරීමට පැහැදිලිව ම අසමත් වූ නිල කම්කරු ව්‍යාපාරයෙහි කනපිට පෙරලුනු ස්වභාවය මෙම වර්ධනයට තීරනාත්මක වී ය. ලේබර් පක්ෂය හා වෘත්තීය සමිති ශාඛා සියල්ල ම පාහේ ජනතාවගේ යුද විරෝධී පෙලපාලිවල පෙනෙන්නට නො සිටි අතර වෘත්තීය සමිති සම්මේලනය විරෝධතාවලට එරෙහිව නිල ප්‍රකාශනයක් නිකුත් කලේ ය. ඉනික්බිතිව, මෙම සංවිධාන දෙක ම ඉරාකයේ මිලිටරි ග්‍රහනය ආරක්ෂා කිරීමට පෙල ගැසී සිටී.

මේ හේතුවෙන් වසර සිය ගනනක් පුරා කටුක පන්ති අරගල ක්‍රියාවලියක් තුලින් දිනා ගත් නෛතික නිදහස විනාශ කිරීමේ සිය සැලසුම් ඉදිරියට ගෙන යෑමට ආන්ඩුව දිරිමත් වී ඇත.

පසු ගිය කාල පරිච්ඡේදය තුල, ලේබර් ආන්ඩුව නිශ්ශබ්දව සිටීමේ අයිතිය ඉවත් කර ඇත; එක පුද්ගලයෙකුට එරෙහිව එක ම වරද සඳහා දෙවරක් නඩු ඇසීමට ඉඩ සලසා ඇත; අසා දැන ගත් දේ පදනම් කොට ගත් සාක්ෂ්‍ය හා කලින් දඬුවම්වලට අදාල සාක්ෂ්‍ය අධිකරනයේ දී පිලිගන්නා බව ප්‍රකාශයට පත් කොට ඇත; නඩු විභාගයක දී ජූරි සභාවක් යොදා ගැනීමේ මූලධර්මය බාදනය වන්නට සලසා ඇත. ''ත්‍රස්තයට එරෙහි යුද්ධයෙහි දී'' වධහිංසා පැමිනවීම තුලින් ලබා ගන්නා සාක්ෂ්‍ය පිලිගන්නා බව ප්‍රකාශයට පත් කිරීම වඩාත් වැදගත් එකකි.

කිසිදු විරෝධයකින් තොරව ම පාහේ බ්‍රිතාන්‍ය ව්‍යවස්ථා නීතියෙහි සුරක්ෂිතව ඇති හබෙයාස් කෝපුස් ආඥාවක් හා අනිකුත් අයිතීන් කටු ගා දැමෙමින් තිබේ. අභ්‍යන්තර කටයුතු පිලිබඳ ලේකම්ගේ හෝ විනිසුරුවරයෙකුගේ කීම මත නඩු විභාගයක් නොමැතිව කෙනෙකු සිය නිවසෙහි ම හිර අඩස්සියෙහි තැබිය හැකි ය. පෙර නොවූ විරූ පරිදි සිවිල් නිදහස සීමා කිරීම නීති යුක්ත කිරීමේ දී සාපරාධී අභිප්‍රායක් පිලිබඳ අවිශ්වාසය පමනක් වුව ද උපුටා දැක්විය හැකි ය. අල් කයිඩා සංවිධානයට එරෙහිව සටන් කිරීමේ පදනම මත පෙරට දමන ලද රෙගුලාසි ජනතාවගේ වඩාත් පුලුල් කොටස්වලට එරෙහිව උපයෝගි කර ගැනීමෙන් ආන්ඩුව වලකා ලීමට කිසිදු විධිවිධානයක් නොමැත.

බිය ගන්වන වාතාවරනයක් ප්‍රවර්ධනය කිරීමට ආන්ඩුව විසින් මැතිවරනය උපයෝගි කර ගනු ඇත්තේ නැවත වාරයක් බලයට පත් වීමෙහි දී බුෂ් ලද සාර්ථකත්වය තමන්ට ද අත් කර ගත හැකි ය යන විශ්වාසයෙන් යුතුව ය. මේ අතර, තමන් අතරින් ''ත්‍රස්තවාදයට එරෙහිව දැඩි පියවර අනුගමනය කරන්නේ'' කවුරුන් ද නීතිය හා සාමය රැකීමට ද පාසල් තුල දැඩි විනයක් ඇති කිරීමට ද සංක්‍රමනිකයින් හ ා රකවරනය පතන්නන් යටපත් කිරීමට ද වඩාත් කැප වී සිටින්නේ කවුරුන් ද යන්න පිලිබඳ විරුද්ධ පක්ෂ, ලේබර් පක්ෂය සමග තරගයක යෙදී සිටී.

කොන්සර්වටිව් පාක්ෂිකයන් සිය මැතිවරන ව්‍යාපාරය සංක්‍රමනිකයන්ට එරෙහිව විරෝධය අවුලුවා ලීම මත කේන්ද්‍රගත කිරීම පාලන බලය දැරූ ලේබර් පක්ෂයේ නින්දිත වාර්තාව විදහා දක්වන මිම්මකි. බ්‍රිතාන්‍යයට ඇතුලු වන්නන්ගේ සංඛ්‍යාව නියත වසයෙන් ම සීමා කිරීමට තමන්ට අවශ්‍ය හෙයින් කොන්සර්වටිව් පක්ෂය ලේබර් පක්ෂයට වඩා දැඩි ස්ථාවරයක සිටින බව ප්‍රකාශ කල ද සත්‍යය නම් තමන් දැන් වාසි ලැබීමට ගසා කන ජනතාව තැති ගැන්වූ වාතාවරනය හා අතිජී භීතිකාව නිර්මානය කිරීමට හේතුකාරක වූ බ්ලෙයාර්ට ටෝරීන් නය ගැති බව යි. තුච්ඡ හා ප්‍රකෝපකාරී බසින් සරනාගතයන්ට, සංක්‍රමනිකයන්ට හා ජිප්සි ගෝත්‍රිකයන්ට එරෙහිව වසර ගනනක් තිස්සේ පුවත්පත්වල නොකඩවා පල වූ ප්‍රවෘත්තිවලින් සකලවිධ සමාජ ගැටලු පිලිබඳව ඔවුන් වෙත වරද පැටවුනි.

මෙයට ලේබර් ආන්ඩුව ප්‍රතිචාරය දැක්වූයේ තවත් සරනාගතයන් වැඩි සංඛ්‍යාවක් රැඳවුම් මධ්‍යස්ථාන වෙත යැවීමටත් පිටුවාහල් කිරීම් වේගවත් කිරීමටත් ඔවුන්ට සැලසෙන සහන අහිමි කිරීමටත් කටයුතු කරමින් සංක්‍රමනිකයන්ට එරෙහිව දැඩි පියවර ගැනීමට තමන් ද කැප වී සිටින බවට උදම් ඇනීමෙනි. සිවිල් අයිතීන්ට එරෙහි පොදු ප්‍රහාරයක් ඉදිරියට ගෙන යෑමටත් අධික බරක් වී ඇති අත්‍යවශ්‍ය සමාජ සේවාවන් සීමා කල යුතු බවට ලේබර් ආන්ඩුව කල ප්‍රකාශයන් යුක්ති සහගත කිරීමටත් සරනාගතයන්ට එල්ල කරන ලද ආන්ඩුවේ එම ප්‍රහාර නැවත නැවතත් උපයෝගි කොට ගෙන ඇත.

## සමාජ අසමානතාවෙහි වර්ධනය

බැලූ බැල්මට ම ත්‍රස්තවාදයෙහි තර්ජනය පිලිබඳ මවා පැමෙහි ද ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් මත එල්ල කර ඇති ප්‍රහාරයෙහි ද පරිමානය අතාර්කික සේ පෙනී යයි. එනමුදු, ආන්ඩුව දැන් අනුගමනය කරන ක්‍රියා මාර්ගයට පාදක වූ දේශපාලන හා පන්ති තර්කනයක් ඇත.

පළමු වැනිව විජිත ශෛලියේ ආධිපත්‍යයක් යළි ඇති කිරීම සඳහා වූ සිය ධාවනය ජාත්‍යන්තර හා අභ්‍යන්තර වසයෙන් ප්‍රතිරෝධයක් අවුලුවන බව පාලක ප්‍රභූව අවබෝධ කර ගෙන සිටී. එවැනි විරෝධයක් පරාජය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මර්දනකාරී පියවරයන් කලින් පැවති නෛතික ප්‍රතිමානයන් හා ප්‍රතිවිරෝධී වේ.

දෙවැනිව, විජිත ජය ගැනීම සඳහා ප්‍රධාන බලවතුන් පොලඹවන එම ආර්ථික ක්‍රියාවලිය ම රට තුළ කම්කරු පන්තිය මත පටවනු ලබන සූරා කෑමෙහි මට්ටම දැවැන්ත ලෙස ඉහළ නැංවීම අවශ්‍ය කරවයි. මෙය පන්ති සබඳතාවල පිපිරෙනසුලු ස්වභාවයකට තුඩු දෙයි.

සුභසාධක රාජ්‍යය බිඳ දැමීමෙන් ද ශ්‍රම වෙළඳ පොළ බිඳ විසුරුවා දැමීමෙන් ද බඳු බර ව්‍යාපාර වෙතින් විස්ථාපනය කර කම්කරු පන්තිය මත පැටවීම මගින් ද 1950 ගනන්වල හා 60 ගනන්වල ලබා දීමට ප්‍රභූවට බල කෙරුනු සියලු සහන යළි පැහැර ගනු ලැබේ.

බ්ලෙයාර් ආන්ඩුව යටතේ එක්සත් රාජධානියේ සමාජ හා දේශපාලන දිවියෙහි සියලු අංග ''පන්තිය හා ධනය අනුව'' ධ්‍රැවීකරනය වී ඇති බව ලේබර් ආන්ඩු පාක්ෂික පොදු ප්‍රතිපත්ති පර්යේෂන ආයතනය පවා පවසා ඇත.

1930 ගනන්වලට පසුව කවර කලෙක වත් නොවූ පරිදි, ජනගහනයෙන් පොහොසත් ම සියයට 1, ජාතික ආදායමෙන් විශාල වැඩි කොටසක් භුක්ති විඳී. ලේබර් පක්ෂය බලයට පත් වීමෙන් පසු, බ්‍රිතාන්‍යයෙහි ධනවත් ම පුද්ගලයින් දහස තම සම්පත්වලට පවුම් බිලියන 150ක් එකතු කොට ගෙන ඇත — මෙය සියයට 152ක වැඩි වීමකි. එක්සත් රාජධානියෙහි දැන් ප්‍රකෝටිපතියෝ 40ක් සිටිති. මෙය වාර්තාගත වී ඇති ඉහළ ම සංඛ්‍යාව යි.

බ්ලෙයාර් ආන්ඩුව මේ ස්තරයට ලන්ඩනය පරාදීසයක් කොට ඇති අතර එය එන්ට එන්ට ම ආන්ඩුවේ සමාජ පදනම බවට පත් වී ඇත. *නිව් ස්ටේට්ස්මන්* සඟරාවෙහි මෑත පළ වුනු ලිපියකින් මෙසේ ප්‍රකාශ කර තිබුනි: ''ලන්ඩනයෙහි ප්‍රකෝටිපතීන් 40ක් සිටිතැයි කියැවේ. ඉන් 13 දෙනෙක් විදේශිකයෝ වෙති. මෙවැනි තැනක් ලොව කොතැනක වත් නැත. ඔවුන් දොහොත් මුදුනෙන් පිළිගනු ලැබේ. මේ අගනුවර ලොව වැදගත් ම බදු සහන ලබා දෙන කෙම්බිම වී ඇත. ඔවුන්ගේ ලොව සමාන්තර ලොවකි. එහි සැහැල්ලු රුවල් නැව්, පුද්ගලික ජෙට් ගුවන්යානා හා වෙනත් තාක්ෂනික ආයිත්තම් සපයන්නන්ට ඉල්ලුමට සරිලන පරිදි එම භාන්ඩ සැපයිය නොහැකි වී තිබේ. රන් පවුම් මිලියන 15කට දියමන්තිවලින් කැටයම් කල පිහිනුම් ඇඳුම් කට්ටලයක් අත් කර ගත හැක්කේ ලොව වෙනත් කොතැනකින් ද?"

මෙයට පරස්පරව, බොහෝ කම්කරුවන්ට අගනුවර හා එහි අවට උපනගරවල තව දුරටත් දිවි ගෙවීම දැරිය නොහැකි වී ඇත. සමාජ ස්තරායනයේ මෙම ක්‍රියාවලිය බ්‍රිතාන්‍යයෙහි සියලු ප්‍රධාන නගර සියල්ලෙහි ම සිදු වෙමින් තිබේ.

මේ තත්වයට හේතු සොයා ගැනීම අපහසු නො වේ. ජනගහනයෙන් පහළ ම සියයට 50 දෙනා මුලු ධනයෙන් තමන්ට හිමි කොටස 1986 දී සියයට 10ක සිට, 2002 වසරේ දී සියයට 5ක් දක්වා දෙකෙන් පංගුවකින් පහත වැටුනු ආකාරය දැක ගත්හ. ලේබර් ආන්ඩුව යටතේ, දුප්පත්කම පිටුදැකීමේ පියවර වසයෙන් තොරොම්බල් කෙරෙන අවම වැටුප හඳුන්වා දීම හා බදු ක්‍රමයෙහි අනෙකුත් වෙනස්කම් ඇති කිරීම මගින් හාම්පුතුන්ට සහන සැලසීමටත් අඩු වැටුප් සහිත ආර්ථිකයක් නිර්මානය කිරීමට උපකාරී වීමටත් යොමු විය. මෙහි ප්‍රතිඵලයක් වසයෙන්, ''වැඩ කරන දුගීන්'' ලෙස දැන් හඳුන්වන කොටස ද ඇතුලුව දිළිඳු බවේ ප්‍රමානය ලේබර් ආන්ඩුව යටතේ පුලුල් වී ඇති අතර ළමුන් අතුරින් තුනෙන් පංගුවකට වැඩි කොටසක් නිල වසයෙන් දුප්පත් ලෙස වර්ගීකරනය කරන ලද නිවෙස්වල වෙසෙති.

බ්‍රිතාන්‍යයෙහි දැන් ඇත්තේ යුරෝපය තුළ වඩාත් ම ප්‍රතිගාමී වූ බදු ක්‍රමවලින් එකකි. ආදායම් බද්දෙහි පාද අනුපාතිකය පහත හෙලීමට ගන්නා ලද පියවරවලින් දුප්පතුන්ට වාසි සැලසී ඇත්තේ ආන්තිකව ය. මේ අතර දැන් පොහොසතුන් ගෙවන්නේ 1945 වසරින් පසු කවර දාටත් අඩු ආදායම් බදු ප්‍රමානයකි, හෙවත් වැට් බද්ද වැනි වක්‍ර බදු ක්‍රමයකට මාරු වීම තුලින් දුප්පතුන් මත වැඩි බරක් පැටවී ඇත. ජනගහනයෙන් පහළ ම සියයට 10 දෙනා තමන් ලබා ගන්නා පවුම් 6,000ට අඩු ගෘහස්ථ වාර්ෂික ආදායමෙන් තුනෙන් පංගුවක් පමන වක්‍ර බදු වසයෙන් ගෙවන අතර ඊට සාපේක්ෂව වර්ෂයකට පවුම් 84,000කට අධික ප්‍රමානයක් උපයන්නන් වක්‍ර බදු වසයෙන් ගෙවන්නේ තම සමස්ත ආදායමෙන් සියයට 10කට කිට්ටු ප්‍රමානයකි.

කම්කරු පන්තියේ කඩා වැටෙන ආදායම සඟවා ලන එක ම සාධකය වන්නේ පුද්ගලික නැන්පතු නය ප්‍රමානයෙහි පුපුරනසුලු වර්ධනය යි. පසු ගිය වසරෙහි මෙය මීට දස වසරකට පෙර තිබූ ප්‍රමානය මෙන් දෙගුනයක් වූ පවුම් බිලියන 980ක් දක්වා ඉහළ ගියේ ය. අලුත් නය ගැනීම් මසකට පවුම් බිලියන 10.7ක අනුපාතිකයකින් වැඩි වීමත් සමග, මේ ග්‍රීෂ්මයේ දී පුද්ගලික නය ප්‍රමානය පවුම් ට්‍රිලියනයක — එනම්, පවුම් බිලියන 1,000ක — සීමාව පසු කර යෑමට නියමිත ය. මෙහි අරුත වන්නේ එක්සත් රාජධානියෙහි පුද්ගලික නය ප්‍රමානය පළමු වතාවට එහි භාන්ඩ හා සේවා නිෂ්පාදනයෙන් උපයන වාර්ෂික ජාතික ආදායමට වඩා වැඩි වනු ඇති බව යි. මෙය ජාත්‍යන්තර සන්දර්භයක් තුළ පිහිටුවන්නේ නම්, මිලියන 58කින් සමන්විත බ්‍රිතාන්‍ය ජනතාවගේ පුද්ගලික නය ප්‍රමානය අප්‍රිකාවේ, ආසියාවේ සහ ලතින් ඇමරිකාවේ සමස්ත බාහිර නයෙහි එකතුවටත් වඩා විශාල ය.

නය වැඩි වසයෙන් ලබා ගන්නේ ආදායම් මත නො ව පවුලට අයත් නිවස ඇපයට තැබීම මත ය. බොහෝ අවස්ථාවන්හි, දේපල උගස්කරයන්හි වටිනාකම වාර්ෂික වැටුප් මෙන් හතරපස් ගුනයකි.

විශ්‍රාම වැටුප් අරමුදල් හා කොටස් මිල ගනන් කඩා වැටීමත් සමග වැඩි දෙනාගේ එක ම සැලකිය යුතු වත්කම වී ඇත්තේ පවුලට අයත් නිවස යි. එය විශ්‍රාම යෑමෙන් පසු අනාගතය සඳහා ඉතිරි කර ගත් වටිනාකම සේ සැලකේ. එම නිසා දේපල වෙලඳ පොලෙහි කඩා වැටීමක් ඇති වුව හොත් එය දසලක්ෂ සංඛ්‍යාත ජනකායක් බංකොලොත් බවට පත් කොට ඔවුන් සුරක්ෂිත බවින් තොර තත්වයකට ඇද දමනු ඇති අතර සමස්ත ආර්ථිකය මත දැඩි බලපෑමක් ද එල්ල කරනු ඇත.

දිලිඳු බවෙහි හා නය ගැති බවෙහි සාමාන්‍ය වැඩි වීමත් සමග වැදගත් සුභසාධන හා සමාජ සේවා මත ලේබර් ආන්ඩුව විසින් ක්‍රමානුකූල ප්‍රහාරයක් එල්ල කොට ඇත. කලින් රාජ්‍ය අංශයට පමනක් සීමා වූ ක්ෂේත්‍ර පුද්ගලීකරනය හා වෙනත් පියවරයන් මගින් මහා ව්‍යාපාර සඳහා ටෝරීන්ගේ පිලිවෙත මෙමගින් දිරි ගන්වා තිබේ.

ලේබර් ආන්ඩුවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය නිසා පාසල් පුද්ගලික අංශයට විවෘත වෙමින් තිබේ. හැකියාව අනුව ශිෂ්‍යයන් තෝරා ගැනීම පහසු කිරීම ඉලක්ක කොට ගත් පියවර ක්‍රියාවට නගමින් ව්‍යාපාරවලින් ප්‍රාග්ධනය ලබා ගැනීමට ලේබර් ආන්ඩුව රජයේ පාසල්වලට ඉඩ සලසයි. එමගින් සමාජමය බෙදීම් උග්‍ර කෙරේ.

ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය නමැති බැනරය යටතේ සිය විෂය ධාරා නිර්නය කිරීමට පාසල්වලට ඉඩ ලැබෙනු ඇත — මේ පියවර දැනට මත් ආගම පදනම් කර ගත් අධ්‍යාපනයෙහි වර්ධනයකට ද මැවුම්කරුවා පිලිබඳ මතය ඉගැන්වීම නීත්‍යානුකූල කිරීමට ද මග පාදා ඇත.

ජාතික සෞඛ්‍ය සේවාව අනුක්‍රමයෙන් පුද්ගලීකරනයට ලක් වීම ද කම්කරු ජනතාවගේ දිගුකාලීන සුභසාධනයට අන්තරාය ගෙන දෙන්නකි. එය ක්‍රියාත්මක වන්නේ ටෝරීන් විසින් පිහිටුවනු ලැබූ ඊනියා පදනම් රෝහල් ක්‍රමය හා ''අභ්‍යන්තර වෙලඳ පොල '' ව්‍යාප්ත කිරීම තුලිනි. පිරිවැය මත පදනම්ව සෞඛ්‍ය සේවාව සීමා කිරීම සාධාරනය කිරීමට සියලු අවස්ථා උපයෝගි කර ගනු ලැබේ.

## මූල්‍ය කතිපයාධිකාරයක පාලනය

සමාජයේ ඉතා කුඩා ස්තරයකගේ ධනය ඇදහිය නොහැකි අන්දමට වර්ධනය වීම හා බ්‍රිතාන්‍ය ආර්ථිකයෙහි සත්‍ය කාර්ය සාධනය අතර සම්බන්ධයක් නැති තරම් ය. ඒ වෙනුවට, එය දේපල හා කොටස් වෙලඳ පොල සමපේක්ෂනයෙහි ද කම්කරු පන්තිය දරිද්‍රතාවට ඇද දැමීමේ සංයෝගයක් තුලින් සුපිරි පොහොසතුන් සුරකින තත්වයක් නිර්මානය කිරීම ද සඳහා බ්ලෙයාර් ආන්ඩුව යටතේ තීව්‍ර කරන ලද ආයාසයක ප්‍රතිඵලයකි.

නිල දේශපාලනය, භූගෝලීය ආර්ථිකයේ වැඩි වර්ධනය සමග බැඳී ඇති වරප්‍රසාදිත ධනපති සමාජ ස්තරයේ සුවිශේෂී බල වැයික්කියකි. පෙර නොවූ විරූ සමාජ ධ්‍රැවීකරනය තව දුරටත් ගෙන යාමට ලේබර් ආන්ඩුවෙහි කැප වීම එයට මූල්‍යාකාර වංශාධිපතීන්ගේ අඛන්ඩ සහාය සුරක්ෂිත කර දී තිබේ.

සමාජ ධ්‍රැවීකරනයෙහි ඓතිහාසිකව නොවූ විරූ එම මට්ටම නියම අරුතින් ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගෙන යාම හා ප්‍රතිවිරෝධීව පිහිටා ඇත. පාර්ලිමේන්තු පාලනය රැඳී ඇත්තේ, සිය සුවිශේෂී ප්‍රතිපත්ති කුමක් වුව ද ධනේශ්වර ලාභ ක්‍රමය එකහෙලා ම ආරක්ෂා කරමින් කම්කරු පන්තියේ පුලුල් කොටස්වල සහාය ලබා ගැනීමට පාලක පන්තියේ පක්ෂ සතු හැකියාව මත ය. මේ ආකාරයේ පාලනයක් අවසාන වසයෙන් රැඳී පවතිනුයේ, සමාජමය බෙදීම් වැඩි දියුනු කරන ආකාරයෙන් කම්කරුවන් අතර සැලකිය යුතු කොටසකගේ ජීවන තත්වයන් නංවා ලීමට පාලක පන්තිය තුල ඇති හැකියාව හා කැමැත්ත මත ය.

එසේ වුව ද, අද දින සුදු කරපටි කම්කරුවන්ගේ හා වෘත්තිකයන්ගේ විශාල කොටස් ද ඇතුලුව, ජනගහනයෙන් අතිබහුතරයක් මුහුන දෙන්නේ ආර්ථික අනාරක්ෂිත බවට හා වැඩි වන නය බරට ය. මහජනතාවගේ වියදමෙන් කුඩා ප්‍රභූ පැලැන්තියක් තර කෙරෙන පිලිවෙතකට ජනවරමක් ලබා ගැනීම අපහසු කටයුත්තකි. සිය මහා ව්‍යාපාරික හාම්පුතුන් විසින් ඉල්ලා සිටින කර්තව්‍යයන් ඉටු කිරීමට නම් ආන්ඩුව සැබවින් ම සමස්ත දේශපාලන ක්‍රියාවලිය ම මහජන පාලනයේ කුමන රූපාකාරයක් වෙතින් හෝ දික්කසාද කල යුතු ය.

ලේබර් පක්ෂයේ දේශපාලන විකසනය මෙම සමාජ ක්‍රියාවලීන්හි පරිපූර්න ප්‍රකාශනය යි. කලින් පැවති කිසිදු පාලනාධිකාරයකටත් වඩා අඩු මට්ටමේ මහජන සහයෝගයක් හිමි කර ගෙන සිටින බ්ලෙයාර් ආන්ඩුව ම බලයෙහි පවතින්නේ කලින් ටෝරීන්ගේ බල කඳවුරු ජය ගැනීමෙන් ය. *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතට අනුව, රටේ වඩාත් ම ධනවත් මැතිවරන කොට්ඨාසවල ඡන්ද දැන් ටෝරි පක්ෂයට වඩා ලේබර් පක්ෂයට ලැබීමට ඉඩ ඇත.

පෙර නොවූ ආකාරයට මැතිවරන ජනමාධ්‍ය මත රඳා පවතින්නේ ද යත් ටැබ්ලොයිඩ් පුවත්පත්වල සහාය ලබා ගැනීම මෙන් ම අපරාධ හා සංක්‍රමනයන් පිලිබඳ භීතිය හා අගතිය අවුලුවා ලීම තීරනාත්මක ය. ඊනියා ප්‍රධාන දේශපාලන ප්‍රවාහයන් ලෙස සැලකෙන පක්ෂවල සිට බ්‍රිතාන්‍ය ජාතික පක්ෂය හා එක්සත් රාජධානියේ ස්වාධීන පක්ෂය වැනි දක්ෂිනාංශික අන්තවාදී සංවිධාන දක්වා වූ සියල්ලෙහි ම සාරභූත තේමාවන් මුලුමනින් ම ක්‍රියාවට නැගෙනුයේ දේශපාලන සංයෝගයෙහි දක්ෂිනාංශය තුල ය.

මෙහි ශුද්ධ ප්‍රතිඵලය වනුයේ සෑම අව්‍යාජ දේශපාලන නියෝජනයකින් ම පුලුල් ජනතාවගේ පන්ති අවශ්‍යතා බැහැර කිරීම ය.

ලේබර් පක්ෂයේ වාමාංශය බව කියා පාන කිසිදු පක්ෂයක් හෝ කන්ඩායමක් අව්‍යාජ විකල්පයක් නියෝජනය නො කරයි. සමාජවාදී කම්කරු පක්ෂය, සමාජවාදී පක්ෂය හා සමාජවාදී ලේබර් පක්ෂය වැනි කන්ඩායම්වල දේශපාලනයෙහි සාරභූත පදනම වනුයේ ධනවාදය අහෝසි කිරීම අරමුනු කොට ගන්නා අව්‍යාජ

සමාජවාදී වැඩ පිළිවෙලක් මත පදනම් වූ කම්කරු පන්තියේ කිසිදු ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක වර්ධනයට විරුද්ධ වීම යි. පැරනි කම්කරු සංවිධානවලින් කම්කරුවන් තව තවත් හුදෙකලා වත් ම, මෙම සංවිධානයන් වරෙක සටන් වැදි ප්‍රතිසංස්කරනවාදී ප්‍රතිපත්ති අසාර්ථක වී ඇති බවට කම්කරුවන් නිවැරදිව ඉවෙන් මෙන් වටහා ගනිත් ම බ්ලෙයාර්ට එරෙහිව ස්ථාවරයක් ගැනීමට ඇති එක ම විභව මග, සමාජ ප්‍රතිසංස්කරනවලින් හෙබි සීමිත වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැගීම සඳහා ලේබර් පක්ෂය හා වෘත්තීය සමිති නිලධරයට බලපෑම් කිරීම ය යි මෙම ''වාම'' කන්ඩායම් වැඩි වැඩියෙන් අවධාරනය කරයි.

මෙය විශද ලෙස අනාවරනය වූයේ ඉරාක යුද්ධයට එරෙහිව මහජන විරෝධතාවන්ට දක්වන ලද ප්‍රතිචාර තුලිනි. නිශ්චිත වූ ධනේශ්වර විරෝධී ප්‍රතිපත්ති මතු කිරීමෙන් සිදු වනුයේ තමන් සමාජවාදීන් ය යි නොසලකන පිරිස් වෙතින් හුදෙකලා වීම පමනකැයි යුද්ධය නැවැත්වීමේ සන්ධානය වටා ගොනු වූ මෙම සංවිධාන තර්ක කලේ ය. මෙය, අවම ප්‍රජාතාන්ත්‍රීය හා සමාජ ඉල්ලීම් මත පදනම්ව විවිධ පන්ති අතර සන්ධාන සඳහා පෙනී සිටීම වෙනුවෙන් කම්කරු පන්තිය මත පදනම් වූ සෑම ආකාරයක දේශපාලනයක් ම අත් හැරීම සඳහා සකසන ලද වට්ටෝරුවක් විය.

මෙම දක්ෂිනාංශික පරාවක්‍රයෙහි පරිපූර්න ප්‍රකාශනය රෙස්පෙක්ට් නමැති සංවිධානය ගොඩ නැගීම තුල දැක ගත හැකි අතර සමාජවාදී කම්කරු පක්ෂය මගින් මෙහෙයවෙන එහි නායකත්වය දරන්නේ ලේබර් පක්ෂයේ දිගුකාලීන නිලධාරියෙකු වන ජෝර්ජ් ගැලෝවේබ් ය. මැතිවරනය තුල එහි කේන්ද්‍රීය ඉලක්කය අනිශ්චිත යුද විරෝධී මනෝභාවයන් වාර්ගික හා ආගමික පදනමේ දේශපාලනයකට මුලුමනින් ම අනුගත වීමක් සමග කලවම් කිරීමෙන් විශේෂිතව ම මුස්ලිම්වරුන්ගේ ඡන්ද දිනා ගැනීමේ උත්සුකයකි.

පන්ති දේශපාලනයට අනන්‍යතා දේශපාලනය ආදේශ කිරීමෙහි යෙදී සිටින්නේ රෙස්පෙක්ට් සංවිධානය පමනක් නො වේ. ස්කොට්ලන්ත සමාජවාදී පක්ෂය එහි සමරූපී එංගලන්ත පක්ෂයෙන් වෙනස් වන්නේ එය සිය දේශපාලන මූලෝපායික පදනම ලෙස විවෘතව ම ජාතිකවාදය වෙනුවෙන් පෙනී සිටින ප්‍රමානය මත පමනකි. භූගෝලීය සංගතයන්ගේ විනාශයට එරෙහිව කම්කරු පන්තියේ අවශ්‍යතාවන් වෙනුවෙන් සටන් කිරීම සඳහා ධනේශ්වර රාජ්‍ය උපයෝගි කොට ගත හැකි ය යි මෙම කන්ඩායම් දෙක ම කියා පායි. එවැනි ප්‍රතිපත්තියක් වූ කලි ලේබර් පක්ෂයේ පැරනි ප්‍රතිසංස්කරනවාදී වැඩ පිළිවෙලෙහි පිරිහුනු ව්‍යක්තියක් පමනි.

## නව පක්ෂයක අවශ්‍යතාව

ලේබර් පක්ෂයෙහි දක්ෂිනාංශික පරිනාමයට හේතු බ්ලෙයාර් වැනි පුද්ගලයින්ගේ ආත්මීය ක්‍රියාවන් තුල සොයා ගත නොහැකි ය. හුදෙක් බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂයෙහි ද වෘත්තීය සමිතිවල ද පිරිහීමට පමනක් නො ව සෑම රටක ම නිල කම්කරු ව්‍යාපාරයෙහි පිරිහීමට ද හේතු සෙවිය හැක්කේ සමාජයේ පදනමෙහි ම ඇති වන ප්‍රගාඪ වෙනස් වීම් තුලින් පමනි.

පැරනි සමාජ ප්‍රජාතාන්ත්‍රීය හා ස්ටැලින්වාදී සංවිධාන කම්කරු ව්‍යාපාරයෙහි ආධිපත්‍යය දැරුවේ ආර්ථික ජීවිතය තව මත් විශාල වශයෙන් ජාතික රාජ්‍යයක් මත සංවිධානය වූ තත්වයන් යටතේ ය. ප්‍රතිසංස්කරන ප්‍රදානය කිරීම සඳහා පාලක පන්තියට පීඩනය දැමීම සඳහා එම සංවිධාන බ්‍රිතාන්‍යය වැනි දියුනු රටවල කම්කරුවන් වෘත්තීය සමිතිවාදයෙහි හා පාර්ලිමේන්තු නියෝජනය දිනා ගැනීමේ උපායයන්හි සංයෝගයකට සීමා කලහ.

මෙම අවස්ථාවාදී හා ජාතිකවාදී නිලධරයේ ආධිපත්‍යයෙහි දිගුකාලීන බලපෑම කම්කරු පන්තියේ දේශපාලන විඥානයට යටින් වල කැපීම විය. සෝවියට් සංගමයෙහි ද නැගෙනහිර යුරෝපෙහි ද ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ කඩා වැටීමට හා බටහිර රටවල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන ප්‍රතිසංස්කරනවාදය මුලුමනින් ම අත හැර දමනු ලැබූ 1980 හා 1990 ගනන්වල තීරනාත්මක වෙනස් වීම්වලට මුහුන පෑමේ දී කම්කරු පන්තිය මුලුමනින් ම නූසූදානම් තත්වයකට ඇද වැටුනි.

කම්කරු පන්තිය පැරනි සංවිධාන විසින් එකහෙලා ම පාවා දීමට තුඩු දුන්නා වූ භූගෝලීයකරනයෙහි වර්ධනය — එනම්, ජාත්‍යන්තර පදනමක් මත නිෂ්පාදනය බෙදා හැරීමට හා භුවමාරුවට අදාල සියලු අංශ සංවිධානය කිරීම — ජාතිකව පදනම් වූ කම්කරු සංවිධානවලට යටින් වල කැපී ය.

ලාභ ක්‍රමයෙහි ආරක්ෂාව ද සීමිත සමාජ ප්‍රතිසංස්කරන වෙනුවෙන් පෙනී සිටීම ද සංයෝජනය කිරීමට කම්කරු නිලධරයට තව දුරටත් ඉඩක් නොතිබින. දැවැන්ත අන්තර්ජාතික සංගත හා මූල්‍ය ආයතනවල සංකේන්ද්‍රිත, භූගෝලීය වශයෙන් සංවිධානය වූ ප්‍රාග්ධනයට නිෂ්පාදනය ලොව වටා මාරු කිරීමටත් ජාතික ආන්ඩුවල ප්‍රතිපත්ති පිලිබඳ ආඥා නිකුත් කිරීමටත් හැකියාව ලැබුනි. පෙර නොවූ විරූ පරිමානයකට දියුනු ධනේශ්වර රටවල ආර්ථික සාර්ථකත්වය දැන් රැඳී පැවතියේ පොදු පිරිවැය විශාල වශයෙන් කපා හැරීම හා ආසියාවේ හා නැගෙනහිර යුරෝපයෙහි පවතින මට්ටම් කරා වැටුප් හා වැඩ කිරීමේ වාතාවරනය පහත හෙලීම තුලින් ජාත්‍යන්තර ආයෝජන ආකර්ෂනය කර ගැනීම හා ලෝක වෙලඳ තරගකාරිත්වය සහතික කිරීම මත ය.

බ්ලෙයාර්ගේ ''නව ලේබර් පක්ෂයේ'' සංවර්ධනය හා වෘත්තීය සමිති ව්‍යාපාරික කලමනාකාරිත්වයෙහි උපාංග බවට පරිවර්තනය වීම ප්‍රාග්ධනයේ මෙම ඉල්ලීමට කම්කරු නිලධරයේ ප්‍රතිචාරය නිරූපනය කරයි.

කම්කරු ව්‍යාපාරයෙහි දිරාපත් වීමට අතීතය කරා ආපසු යෑම මගින් පිලිතුරු දීමේ හැකියාවක් නැත. ජාතික ආර්ථික නියාමනය වෙනුවෙන් කෙරෙන ඉල්ලීම් ප්‍රතිගාමී වන්නා සේ ම අප්‍රානික ද වේ. මහා ව්‍යාපාරවල සූරා කෑමේ අරමුනුවලට එරෙහිව ඒවාට සටන් වැදිය

නොහැකි අතර එමගින් සිදු වන්නේ ජාත්‍යන්තර කම්කරු පන්තිය බෙදී යාම පමනි.

භාෂාව, ජාතිය හෝ සමෙහි පාට නො සලකා සෑම රටක ම හා සියලු ජාතික දේශ සීමා හරහා කම්කරු පන්තිය එක්සත් කිරීමේ සටනක් මත සමාජවාදී සමානතා පක්ෂය පදනම් වෙයි. යුදවාදය හා යුද්ධය කරා ලුහුටා යාමට එරෙහිව සටන් වැදීම සඳහා මෙය සාරභූත අඩිතාලමක් සපයයි.

වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් සමාජයේ පූර්න ප්‍රතිසංවිධානයක් සඳහා වැඩ පිලිවෙලක් අපි ඉදිරිපත් කරමු. මේ අරමුන පෙරදැරි කොට ගෙන, පුද්ගලික ලාභය සඳහා නො ව, අතිමහත් බහුතරයේ අවශ්‍යතාවන් පදනම් කොට ගෙන නව සමාජ හා ආර්ථික පර්යායක් නිර්මානය කිරීමට පක්ෂව අපි කතා කරමු. දුප්පත්කම අහෝසි කිරීමටත් සියලු දෙනාට ම යහපත් ජීවන තත්වයක් හා සුරක්ෂිත පරිසරයක් ඇති කිරීමටත් දැනට අප සතුව ඇති අසාමාන්‍ය මානව හා තාක්ෂනික සම්පත් උපයෝගි කර ගැනීම සඳහා පදනම සැපයෙන්නේ මේ තුලින් පමනි.

## ඉරාකයේ ග්‍රහනය අවසන් කරනු යුරෝපා එක්සත් සමාජවාදී ජනපදයක් කරා

විජිත මර්දනය යලි ඇරඹීමට සමාජවාදී සමානතා පක්ෂය අශාම්‍ය ලෙස විරුද්ධ වෙයි. බ්‍රිතාන්‍යය එක්සත් ජනපද හා සියලු විදේශීය හමුදාවන් වහා ම හා කොන්දේසි විරහිතව ඉරාකයෙන් ඉවත් කර ගන්නා මෙන් ද රට නීති විරෝධීව අල්ලා ගෙන සිටීම අවසන් කරන ලෙස ද අපි ඉල්ලා සිටිමු. ගුවන්තනාමෝ බේහි හා ලොව වටා පිහිටා ඇති අනෙකුත් එක්සත් ජනපද සිර ගෙවල හා රැඳවුම් කඳවුරුවල සිර කොට ඇති රැඳවියන් ද ඇතුලුව ඇෆ්ඝනිස්ථානය හා ඉරාක ආක්‍රමනවලින් අල්ලා ගත් සියලු සිරකරුවන් නිදහස් කරන මෙන් අපි ඉල්ලා සිටිමු.

යුදවාදය හා සමාජ කොන්දේසි විනාශ කිරීමට එරෙහිව ඵලදායී අරගලයක් සඳහා සාරභූත පදනම වනුයේ යුරෝපා කම්කරු පන්තියේ එක්සත් දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම යි.

යුරෝපා මහාද්වීපයෙහි ආර්ථික හා දේශපාලන ජීවිතය දැනට මත් නාටකාකාර ඒකාග්‍රකරනයක් අත්විඳ ඇත. එනමුදු, මෙය ක්‍රියාත්මක කරන ලද්දේ සුවිශේෂව ධනේශ්වරයේ අවශ්‍යතාවන් සඳහාත් කම්කරු පන්තියට අවාසි ගෙන දෙන ආකාරයටත් ය.

ධනේශ්වරය සඳහා නම් යුරෝපය එක්සත් කිරීම වනාහි එක්සත් ජනපදයට හා ආසියාවට එරෙහිව වෙලඳාම හා ආයෝජන සම්බන්ධයෙන් ඵලදායී ලෙස තරග කිරීමේ හැකියාව සහිත දැවැන්ත අභ්‍යන්තර වෙලඳ පොලක් නිර්මානය කිරීම යි. ඕනෑ ම බාධකයකින් අන්තර්ජාතික සංගත නිදහස් කිරීම සඳහාත් සමාජ ආරක්ෂන ඉවත් කිරීම සඳහාත්, වැටුප් පහත හෙලීම සඳහාත් යුරෝපයේ ඒකාබද්ධ මිලිටරි ශක්තිය වර්ධනය කිරීම සඳහාත් මෙවලමක් සේ යුරෝපා සංගමය ක්‍රියාත්මක වෙයි.

සමාජවාදී සමානතා පක්ෂය යුරෝපා සංගමයට විරුද්ධ වන අතර ම ජාතික රාජ්‍යයෙහි ආයතන වඩාත් ''වගකිව යුතු'' හා ''ප්‍රජාතාන්ත්‍රීය'' ඒවා ලෙස හුවා දැක්වීම මත යුරෝපා සංගමයේ දක්ෂිනාංශික ප්‍රතිපත්ති කෙරෙහි පවතින විරෝධය එම ආයතන ආරක්ෂා කිරීමට යොමු කිරීමට කැප වී සිටින සියල්ලන්ට මත් සමාජවාදී සමානතා පක්ෂය විරුද්ධ වෙයි. භූගෝලීයකෘත නිෂ්පාදනයේ කොන්දේසි යටතේ, කම්කරු පන්තියෙහි ක්‍රියාවන් ජාතික ක්ෂේත්‍රයට පමනක් සීමා කිරීම ව්‍යසනයකට සූදානම් කෙරෙන වට්ටෝරුවකි.

ප්‍රගතිශීලී ලෙස යුරෝපය එක්සත් කල හැක්කේ කම්කරු පන්තියෙහි ස්වාධීන දේශපාලන ක්‍රියාවන් තුලින් පමනි. කම්කරු ජනතාවට සිය ස්වාධීන සමාජ හා ප්‍රජාතාන්ත්‍රීය අවශ්‍යතාවන් ඉදිරියට ගෙන යා හැක්කේ යුරෝපා එක්සත් සමාජවාදී ජනපදයක් බිහි කිරීම හරහා පමනකි. යල් පැන ගිය ජාතික දේශ සීමා අහෝසි කිරීමටත් මූලික සමාජ අවශ්‍යතාවන් සාක්ෂාත් කිරීම සඳහා නිෂ්පාදනයේ කාර්යක්ෂම ප්‍රතිසංවිධානයක් සැලසුම් කිරීමටත් එමගින් මං සැලසෙනු ඇත.

තව ද, එක්සත් ජනපද යුදවාදයට එරෙහි අව්‍යාජ වූ අධිරාජ්‍ය විරෝධී බලවේගයක් මෙහෙයවීම සඳහා එය බලගතු පදනමක් සපයනු ඇත. එම බලවේගය පීඩිත රටවල දසලක්ෂ සංඛ්‍යාත කම්කරු ජනතාව ප්‍රබෝධමත් කරනු ඇතිවා පමනක් නො ව බුෂ් පාලන තන්ත්‍රය හා පෙන්ටගනයෙහි යුද යන්ත්‍රනයට එරෙහි සිය අරගලයේ දී ඇමරිකානු කම්කරුවන් ද ශක්තිමත් කරනු ඇත.

## කම්කරු ආන්ඩුවක් සඳහා සටන

ලාභ ක්‍රමය පුලුල් ජනතාවගේ සාරභූත අවශ්‍යතාවන් හා අසංගත වේ. කම්කරු ජනතාවගේ සාමාජීය හා ආර්ථික අවශ්‍යතාවන් නියෝජනය කරන්නා වූ ද ඔවුන්ගේ ජීවිතවලට බලපාන තීරන සම්බන්ධයෙන් ඔවුන්ට ප්‍රජාතාන්ත්‍රීය පාලනයක් ලබා දෙන්නාවූ ද කම්කරු ආන්ඩුවක් ස්ථාපනය කිරීම වෙනුවෙන් අපි කතා කරමු.

ඡන්දය පාවිච්චි කිරීම, ඡන්දදායක අයිතිවාසිකම් හා සිවිල් නිදහස ඇතුලුව අතීතයෙහි අත්පත් කර ගත් සෑම ප්‍රජාතාන්ත්‍රීය අයිතියක් ම සමාජවාදී සමානතා පක්ෂය වෙහෙස නො බලා ආරක්ෂා කරයි. වැඩ වර්ජනවලට හා පිකට් කිරීමට එරෙහි සෑම නීතියක් ම අවලංගු කල යුතු ය. ජාතිකත්වය, වාර්ගික පසුබිම, ආගම, ලිංගිකත්වය හා ලිංගික මනාපය මත පදනම් වූ සියලු වෙනස්කම් කිරීම් නීති විරෝධී කල යුතු ය. රැඳවුම් මධ්‍යස්ථානවල නවතා ගෙන සිටින සරනාගතයන් වහා ම නිදහස් කල යුතු ය. සියලු ආකාරයේ සංක්‍රමන පාලනය කිරීම් හා සංචාරක සීමා කිරීම් අවසන් කරන ලෙස අපි ඉල්ලා සිටිමු. සියලු පුරවැසි අයිතීන් හා සමාජ ප්‍රතිලාභවලට පූර්න ප්‍රවේශයක් සහිතව, තමන් කැමති තැනක වාසය

කිරීමටත් වැඩෙහි යෙදීමටත් කම්කරුවන්ට අයිතිය තිබිය යුතු ය. සිය කැමැත්ත පරිදි ගබ්සා කිරීමේ සීමා රහිත අයිතිය ස්ත්‍රීන්ට තිබිය යුතු ය.

දැවැන්ත සමාජ හා ආර්ථික අසමානතාව සඟවාලන නීතිය ඉදිරියේ රූපික සමානතාවෙන් ඔබ්බට ප්‍රජාතාන්ත්‍රීය අයිතිය පිලිබඳ සංකල්පය පුලුල් කල යුතු ය. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීමට නම්, ආර්ථික තීරන ගැනීම්, වැඩ කරන තත්වයන් හා සිය දෛනික ජීවිත පිලිබඳ තත්වයන් සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ පාලනය අවශ්‍ය කෙරේ. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය සාක්ෂාත් කර ගත හැක්කේ දැනුවත් හා පන්ති සවිඥානකත්වයෙන් යුත් කම්කරු ජනතාව සමාජවාදය සඳහා අරගලය තුල දේශපාලනික බලමුලු ගැන්වීමෙන් පමනි.

## සමාජ සමානතාව සඳහා

මහජනතාවගේ ආර්ථික අනාරක්ෂිත භාවයට හා දසලක්ෂ සංඛ්‍යාත ජනතාව දරිද්‍රතාවට පත් කරන අංගලක්ෂනවලින් හෙබි ලොවකට ප්‍රතිවිරුද්ධව සැබවින් ම නිදහස් හා ප්‍රජාතාන්ත්‍රීය සමාජයක් ස්ථාපනය කිරීමට සාරභූත පදනම වශයෙන් සමාජ සමානතාව සඳහා අරගලය අපි ඉදිරිපත් කරමු.

බැංකු හා මූල්‍ය ආයතන සමග සියලු විශාල කර්මාන්ත, කෘෂිකාර්මික ව්‍යාපාර පොදු අයිතිය යටතට ගත යුතු අතර සුලු කොටස් හිමිකරුවන්ට පූර්න වන්දි ලබා දිය යුතු ය. විශාල කොටස් හිමිකරුවන්ට වන්දි ගෙවීමේ කොන්දේසි ප්‍රසිද්ධියේ සාකච්ඡාවට භාජන කල යුතු ය.

සියල්ලන්ට ම පූර්න රැකියා නියුක්තිය හා හොඳ වැටුප් ගෙවන රැකියා සහිතක කරනු වස් දැවැන්ත පොදු වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස අපි යෝජනා කරමු. රැකියා නිර්මානය කර දේශපාලන හා සංස්කෘතික දිවියෙහි පූර්න සහභාගිත්වයක් සඳහා කම්කරුවන්ට ඉඩ සලසනු වස් වැටුප් අඩු නො කර වැඩ කරන සතිය පැය 30කට සීමා කල යුතු ය.

වැඩ කල නොහැකි අයට — ආබාධිතයන්ට, තනි වූ දෙමාපියන්ට, රෝගීන්ට — අභිමානවත් හා යහපත් දිවි පැවැත්මක් සඳහා වැටුපකට සමාන දීමනාවක් ගෙවිය යුතු ය. විශ්‍රාම ගන්නා අවස්ථාවෙහි දී සෑම පුරවැසියෙකුට ම ජීවත් වීම පහසු කරන විශ්‍රාම වැටුපක් සහතික කල යුතු අතර, හාම්පුතුන් විසින් පවත්නා විශ්‍රාම වැටුප් කොල්ල කෑම සාපරාධී ක්‍රියාවක් කල යුතු ය.

සෞඛ්‍ය පහසුකම් හා හොඳ අධ්‍යාපනයක් ලබා දීම සාර්වත්‍රික අයිතියක් සේ සලකා කිසිදු අය කිරීමකින් තොරව ලබා දිය යුතු ය. එම සේවාවන්ට නූතන තාක්ෂනයන්හි නිසි පුහුනුව ලත් කාර්ය මන්ඩල සපයා දිය හැකි පරිදි රෝහල්වලට, පාසල්වලට, විශ්වවිද්‍යාලවලට හා ළමාරක්ෂක පහසුකම්වලට පවුම් බිලියන ගනනින් මුදල් යෙදවිය යුතු ය. පොදු නිවාස විකුනා දැමීම අවසන් කල යුතු අතර ඔරොත්තු දෙන අන්දමේ නිවාස තැනීමේ දැවැන්ත වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කල යුතු ය. නිවහනක් සඳහා සිය ආදායමෙන් සියයට 20කට අධික ප්‍රතිශතයක් කිසිදු කම්කරුවෙකුට ගෙවීමට සිදු නොවන පරිදි ගෙවල් කුලී හා උගස්කර ගෙවීම් සීමා කල යුතු ය. එවැනි පියවර, විද්‍යාත්මක සංවර්ධනය ඉදිරියට ගෙන යෑමටත් සංස්කෘතික දිවියට මුදල් සැපයීමටත් කැප වුනු ප්‍රතිපත්ති සමග ඒකාබද්ධ කල යුතු ය. එවන් පහසුකම් පුලුල් ජනතාවට ලැබීමෙන් එය සෑම මිනිසෙකුගේ ම පූර්න වර්ධනයට ද සමස්තයක් වසයෙන් සමාජයට ද දායක වනු ඇත.

## සමාජවාදී සමානතා පක්ෂය ගොඩ නගන්න

සමාජවාදී සමානතා පක්ෂය හතර වැනි ජාත්‍යන්තරයේ බ්‍රිතාන්‍ය ශාඛාව යි. එය ලියොන් ට්‍රොට්ස්කි විසින් 1938 වසරෙහි දී පිහිටුවන ලද්දේ ස්ටැලින්වාදයට හා සමාජ ප්‍රතිසංස්කරනවාදයට එරෙහි අරගලයක් තුල ලෝක සමාජවාදී විප්ලවය පිලිබඳ වැඩ පිලිවෙල ආරක්ෂා කිරීම සඳහා යි.

සමාජවාදය හුදෙක් ම ව්‍යාප්ත වූ වෘත්තීය සමිති සටන්කාමීත්වයෙහි අවසන් නිමැවුම ය යන මතය අපි ප්‍රතික්ෂේප කරමු. ඒ සඳහා ඉහල සංස්කෘතික මට්ටමක් හා සැලසුම් කිරීමක් අවශ්‍ය ය. එය පිහිටුවිය හැක්කේ සිය පක්ෂයෙහි මග පෙන්වීම යටතේ දේශපාලනිකව සවිඥානක කම්කරු පන්තියේ ක්‍රියාකාරිත්වය තුලින් පමනකි.

සමාජවාදී පක්ෂයක ප්‍රමුඛ කාර්යය වන්නේ වැඩ කරන ජනතාවට අධ්‍යාපනයක් හා දැනුවත් භාවයක් ලබා දීමත් එමගින් තීරනාත්මක සාමූහික ක්‍රියාවන්ට පදනම සැකසීමත් ය. මේ අරමුන පෙරදැරි කොට ගෙන හතර වැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සිය අන්තර්ජාල මධ්‍යස්ථානය ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ද ස්ථාපනය කර ඇත. ඒ සමකාලීන සිද්ධීන් සම්බන්ධයෙන් මාක්ස්වාදී විශ්ලේෂනයක් සැපයීම සඳහාත් සෑම රටක ම කම්කරුවන්ට සමාජවාදී වැඩ පිලිවෙලක් ඉදිරිපත් කිරීම සඳහාත් ය.

යුද්ධයට සමාජ අසමානතාවට හා ප්‍රතිගාමිත්වයට එරෙහිව විකල්පයක් සොයන බ්‍රිතාන්‍යයෙහි සියලු කම්කරුවන්ට හා තරුනයන්ට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන මෙන් ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* තුලින් අප වැඩ පිලිවෙල පිලිබඳ සාකාච්ඡාවන්ට සහභාගි වන මෙන් ද අපි උදක් ම ඉල්ලා සිටිමු. අන් සියල්ලට ම වඩා, සමාජවාදී සමානතා පක්ෂයට බැඳී එය කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂය වසයෙන් ගොඩ නගන මෙන් අප වැඩ පිලිවෙල හා එකඟ වන සියල්ලන්ගෙන් ම අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org